- ❖ නිපුනතාවය - ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යායන් ප්‍රකට කරයි.
- ❖ නිපුනතා මට්ටම - චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.
- ❖ පාඩම - සංස්කෘත නාට්‍ය රංග ශෛලියේ භාෂණ විධි

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01)නළුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් හෝ එක විට එකම හඬකින් දෙබස පැවසීම.

1. ඒකල භාෂණයයි 2. ප්‍රකාශන භාෂණයයි 3. ආත්මගත
4. ජනාන්තික භාෂණයයි 5. සාමූහික භාෂණයයි

(02) සුසුම්ලා) "අනේ අප්පේ, දඩයමට කැදර රජ්ජුරුවෝ එක්කලා තියෙන යාළුකම හින්දා මම දැන් හොඳටම හෙම්බත් වෙලයි ඉන්නේ" ඉහත ප්‍රකාශය,

1. ස්වගත භාෂාණයකි 2. ඒකල භාෂාණයකි 3. රහස් කථනයකි.
4. අපවාරිත භාෂණයකි 5. ප්‍රකාශ භාෂණයකි

(03) ආකාශ භාෂිතය වනුයේ,

1. චරිතයක් තමාගේ අභ්‍යන්තර හැඟීම් තමාටම කියා ගන්නා අයුරින් ප්‍රකාශ කිරීම.
2. ප්‍රේක්ෂකාගාරය දෘෂ්‍යමාන නොවන චරිතයක් හා සංවාදයේ යෙදෙන බව හඟවමින් පවසන දෙබස
3. රහසක් කීම
4. චරිතයක් ප්‍රේක්ෂකයන් දෙසට හැරී ඔවුනට යමක් පවසන ලෙස භාෂණයේ යෙදීම.
5. ප්‍රේක්ෂකාගාරයේ සියළුම දෙනාට ම ඇසෙන ලෙස ප්‍රකාශ කිරීම.

(04) ඒකල භාෂණයට අයත් නිවැරදි වරණය වන්නේ,

1. ත්‍රිපතාක නම් මුද්‍රාව භාවිතය.
2. වේදිකාව තමන් යටතට ගෙන තමන් ඉදිරියේ ප්‍රේක්ෂක පිරිසක් සිටින බව දැන් ඔවුන් අමතා කතාවක ස්රූපය ගැනීම
3.වේදිකාවෙන් ඉවත සිටින චරිතය පවසන දෙය අසන බව අභිනයෙන් ඇඟවීම.
4.රහසක් කීම.
5. චරිත කිහිපයක් වේදිකාවේ රැඳී සිටින විට එක් චරිතයක් තවත් චරිතයකට පමණක් ඇසෙන කතා කිරීම.

(05) තාත්විකව රහස් කීම ඉදිරිපත් කිරීම හා දෙබස් චලන ලෝක ධර්මී ස්වරූපයෙන් ඉදිරිපත් කරනු ලබන විධි ද්විත්වය වන්නේ,

1. ප්‍රකාශ භාෂණය හා ජනාන්තික භාෂණය
2.රහස්‍ය කථනය හා අපවාරිත භාෂණය
3. ආත්මගත භාෂණය ස්වගත භාෂණය
4. රහස්‍ය කථනය හා ඒකල භාෂණය
5. ආකාශ භාෂිත හා රහස්‍ය කථනය

**II - කොටස**

(01).

i. සංස්කෘතික නාට්‍ය කලාවේ සංවාද හා රඟපෑම් මගින් ඉදිරිපත් කරන ලද ලිඛිත පිටපත් සහිත නාට්‍ය ප්‍රභේද (රූපක) 05 ක් නම් කරන්න

ii. කෙටි සටහන් ලියන්න

1. සාමූහික භාෂණ 2. ඒකල භාෂණ 3. ආකාශ භාෂිත

iii. කාලිදාසයන්ගේ 'අභිඥාන ශාකුන්තලය' ඇසුරෙන් එහි සඳහන් භාෂණ විධි පිළිබඳ උදාහරණ සහිතව විමසන්න